# පුංචි සිහිනිගේ මල් වත්ත



ජේ.එම්. මිනාරා ඔනාදි ජයතිලක

# පුංචි සිහිනිගේ මල් වත්ත

කර්තෘ  ජේ.එම්. මිනාරා ඕනාදි ජයතිලක
4 ශ්‍රේණිය C
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

කර්තෘගේ වෙනත් කෘති - පුංචි කූඹි යාළුවෝ

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2023

ISBN No 978-624-208-099-4

# පිදුම

මෙම පොත ලිවීම සදහා

මා යොමු කළ අප පංති භාර

ගුරුතුමිය වන ප්‍රියන්ති

ගුරු මෑණියන්ට

එම්.එම්. සෙනෙවිරත්න

ගුරු පියාණන්ට හා මාගේ

දෙමව්පියන්ට

ආදරයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙකිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
**2023.10.20**

සිහිනි කියන්නේ පොඩි ළමයෙක්. පුංචි සිහිනි ආසයි පාට පාට මල් වලට. සිහිනිගේ එහා ගෙදර හිටියෙත් සිහිනිගේ වයසේම පොඩි ළමයෙක්. එයාගේ නම මෙතුනි. එයාට තිබුණේ සිහිනි ආසම විදිහෙ පාට පාට මල් වලින් පිරුණු වත්තක්. මෙතුනිගේ මල් වත්ත හැමවෙලේම ලස්සන සමනලයින්ගෙන් පිරිලා තිබුණා.



ඒ නිසා මෙතුනිගේ මල් වත්තේ මල් යාලුවෝ හිටියේ හරිම සතුටින්. සිහිනිත් මෙතුනිගේ වගේ මල් වත්තකට ගොඩක් ආසාවෙන් හිටියේ. දවසක් සිහිනි එයාගේ අම්මට කිව්වා "මටත් මෙතුනිගේ වගේ මල් වත්තක් ඕනේ" කියලා. සිහිනිගේ අම්මා සිහිනිට මල් පැළ ටිකක් ගෙනත් දීලා කිව්වා "ඔයත් අද ඉදන්ම මල් වවන්න පටන් ගන්න" කියලා. සිහිනිත් හරිම ආසාවෙන් ඒ මල් පැළ එයාගේ ගෙවත්තේ පැළ කරා.

සිහිනි මල් පැළ ටික පළවෙනි දවස් ටිකේ බලාගත්තත් පස්සේ එයාට මල් පැළ බලාගන්න අමතක වුණා. ඒ නිසා එයාගේ මල් වත්තේ මෙතුනිගේ තරම් ලස්සනට මල් පිපුණේ නෑ. සමනල් යාලුවෝ කිසිකෙනෙක් එයාගේ මල් වත්තට ආවෙත් නෑ. ඒ නිසා එයාට මෙතුනිගේ මල් වත්ත ගැන ගොඩක් ඉරිසියා හිතුණා. සිහිනිගේ ඉරිසියාව දැකපු පුංචි මල් යාලුවෝත් පිපෙන්නේ නැතුව ඉන්න කතා වුණා. මේ නිසා සිහිනිට තරහා ගිහින් එයාගේ මල් වත්තේ පුංචි මල් යාලුවන්ට බැන්නා. පුංචි මල් යාලුවෝ හරිම දුකින් හිටියේ. මේක බලන් හිටපු මෙතුනිගේ මල් වත්තේ සමනල් යාලුවෝ මෙතුනිට මේ ගැන කිව්වා.



සිහිනිගේ මල් යාලුවෝ ගැන දුක හිතුන මෙතුනි එයාගේ මල් වත්තෙන් ලස්සන මල් යාලුවෙකුත් අරගෙන සිහිනිගේ ගෙදර ගියා.

සිහිනිගේ ගෙදරට එන මෙතුනිව දැකපු සිහිනි ඉක්මනට දුවගෙන ගිහින් එයාගේ කාමරේ හැංගුනා. සිහිනිගේ අම්මා මෙතුනිට කිව්වා "සිහිනි කාමරේ ඇතුලේ ඉන්නේ ගිහින් බලන්න" කියලා. මෙතුනි එයාගේ ලස්සනම ලස්සන මල් යාලුවත් එක්ක සිහිනි ළගට ගියා. මෙතුනිව දැකපු සිහිනි මෙතුනි දිහා බලන්නේ නැතුව අහක බලා ගත්තා. සිහිනි ළගට ගිය මෙතුනි සිහිනිට කතා කරලා කිවුවා "ඔයා මේ මල් යාලුවාව ඔයාගේ මල් වත්තේ පැළ කරන්න" කියලා.

සිහිනි මෙතුනි දිහා බැලුවාම එයාගේ අතේ තිබුණේ එයා ආසම විදිහේ රෝස පාට මල් පැළයක්. සිහිනි හරිම ආසාවෙන් මෙතුනි අතේ තිබුණ මල් යාලුවාව අතට ගත්තා.



සිහිනි මෙතුනිට ගොඩක් ස්තූති කරා. මෙතුනි සිහිනිට කිවුවා "ඔයා මල් පැළ කරාට විතරක් මදි. ඔයා ඒවට හොඳින් සලකන්න ඕන. ඒවට හොඳින් කතා කරන්න. හැමදාම එයාලව බලන්න යන්න" කියලා. මෙතුනි කියපු දේවල් ඒ විදිහටම කරනවා කියලා සිහිනි මෙතුනිට පොරොන්දු වුණා. මෙතුනි ගෙදරින් ගිය ගමන්ම සිහිනි එයාගේ වත්තට දුවලා ගිහින් මෙතුනි දුන්න මල් යාලුවාව පැළ කරා. සිහිනි එදා ඉඳන් එයාගේ වත්තේ හිටපු මල් යාලුවන්ව හොදට බලා ගත්තා. එයාලට හැමදාම වතුර දාලා හොඳින් සැලකුවා. එයාලට ආදරෙන් කතා කරා. හැමදාම එයාලව බලන්න ගියා. මෙතුනි කියපු හැමදෙයක්ම කරා.



සිහිනිගේ මේ වෙනස දිහා බලන් හිටපු මල් යාලුවෝ ගොඩක් සතුටු වුණා. එයාලා කතා වුණා සිහිනි එයාලට මේ කරන උදවුවලට සිහිනිට තෑග්ගක් දෙන්න ඕන කියලා. එක දවසක් උදේම සිහිනි නැගිටලා එයාගේ මල් යාලුවොන්ව බලන්න වත්තට ගියේ හරිම සතුටින්. එයා වත්තට යනකොට හිතාගන්න බැරි දෙයක් වෙලා තිබුණා.

එයාගේ මල් වත්ත පාට පාට මල් යාලුවන්ගෙන් පිරිලා තිබුණා. මල් යාලුවොත් එක්ක කතා කර කර සමනල් යාලුවොත් ගොඩක් හිටියා. සිහිනිට ගොඩක් සතුටු හිතුණා. එයා හරිම සතුටෙන් මල් වත්තේ හැමතැනම ඇවිද්දා.



ඊට පස්සේ එයා ඉක්මනට දුවලා ගිහින් එයාගේ අම්මවයි තාත්තාවයි එක්කගෙන ඇවිත් එයාගේ මල් වත්ත පෙන්නුවා. එයාගේ අම්මටයිත් තාත්තාටයිත් ගොඩක් සතුටුයි. එයා මෙතුනිටත් කතා කරලා එයාගේ මල් යාලුවන්ව පෙන්නුවා. මෙතුනිටත් ගොඩක් සතුටුයි. එදා ඉදන් සිහිනියි මෙතුනියි එකතු වෙලා මල් ගොඩක් වැවුවා. දෙන්නම තමන්ගේ මල් යාලුවන්ව ආදරෙන් බලා ගත්තා. දෙන්නගේම මල් වතු හැමදාමත් ලස්සන සමනල් යාලුවන්ගෙන් පිරිලා තිබුණා.

## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20